" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE


204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000


SLSI ISO 9001 — SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2020 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2020-06-10 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරී,

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020, 07/2020(I) හා 07/2020(II) බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>**

පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2 හා 2020.05.14 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020, 2020-03-26 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020(I), 2020-03-29 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020(II), 2020-04-04 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.ජී. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් (බ.ප.) වෙනුවට.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2020

මගේ අංකය : EST-06/04/LOANS/4072
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.03.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම</u>

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හී 11.2 සහ 11.3 වගන්තින්හී වර්ගීකරණට අනුව මාණ්ඩලික නිලධර ගණයට අයත් වන රජයේ නිලධරයන් හැර අනෙකුත් රජයේ නිලධරයන් සඳහා වාර්ෂික අය වැය ඇස්තමේන්තුවල II කොටසේ අත්තිකාරම් ගිණුම්වල, “රජයේ නිලධරයන්ට අත්තිකාරම්” යන ශීර්ෂය යටතේ ලබා දී ඇති ණය වෙනුවෙන් මෙම වසරේ අප්‍රේල් සහ මැයි මාස සඳහා අයවිය යුතු ණය වාරික සහ ණය පොලිය එම නිලධයන්ගේ වැටුපෙන් අය නොකළ යුතුය.

02. 2020 අප්‍රේල් මස වැටුප, අප්‍රේල් මස 08 දින ගෙවීමට කටයුතු කරන අතර, ඒ අනුව මේ වසරේ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් උත්සව අත්තිකාරම් ගෙවීමට කටයුතු කරනු නොලැබේ.

03. මෙම චක්‍රලේඛය ජනාධිපති කාර්යාලයේ උපදෙස් මත හා මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කෙරේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය